# ජීවන ගමන

**මව් කුස සිට මිහි කුස දක්වා
යන ගමනයි ආ ආ ආ ... යන ගමනයි
හුලු එලි දල්වා
පය පැකිලී වැටි වැටි
යන ගමනයි ආ ආ ආ ... යන ගමනයි**

**ආ මග නොපෙනෙයි
මතකයෙ නොරුඳෙයි
යන මග නොදනියි
නැත සිතියම් ආ ආ ආ ...
නැත සිතියම්
ආ ආ ආ ...**

**මව් කුස සිට ...**

**ගමනයි උරුමය
නැත නවතින තැන
අම්බලමක් නැත ඉදිකරලා ආ ආ ආ ...
කාහට හැකිවෙද
පෙරටුව යන්නට
මිනිසෙක් හෝ දෙවියෙක් කිසිදා**

**මව් කුස සිට ...**

**විකුම්**
June 12, 2001

©2001 by author. This work may be printed and/or distributed **freely** provided this statement is intact. However, this work may not be produced commercially or included in *any media that is sold to the public* without written permission from the author. It may be used as lyrics or associated with any other form of artwork, provided proper and customary credits are given.